ඇස් වහ කට වහ

පුරාණ ශ්‍රී ලංකාවේ ගැමියන් තුළ යාග හෝම, හදි නූනියම්, බලි තොවිල් වැනි ඇදහිලි, විශ්වාස අතර ඇස්වහ කටවහ දෝශ වලටද ඇත්තේ නොමඳ සැලකිල්ලකි. ඔවුන් ඒ පිළිබඳව කොතරම් සැලකිලිමත් වීද යත්, සෑදෙන ස්වාංග ලෙඩ රෝගවලට ගමේ වෙද මහතා හමුවී බේත් හේත් ගන්නවා මෙන්, යන්ත්‍ර, මන්ත්‍ර, ගුරුකම් අතේ වැඩවලට ගමේ කට්ටඩිරාළ හමු වෙනවාක් මෙන් ඇස්වහ කටවහ දෝශවලට වතුර මතුරවා ගැනීමම වැනි ප්‍රතිකාර කර ගැනීම සඳහාද කට්ටඩි රාළගේ හෝ වෙද මහතාගේ සහාය පතා ඇත.

ඇස්වහ කටවහ ගැන ඉතා රසවත් කථා සමූහයක් මා අසා දැන ගත්තේ, මගේ පිය පාර්ශවයේ මිත්තනියගෙනි. මා කුඩා කල හැඳී වැඩී ඇත්තේ පියාගේ මහ ගෙදර නිසා, මිත්තනිය තුරුලේ හිඳ ඇගේ මතක ගබඩාව අවුස්සා ඇගේ ළමාවිය සහ තරුණ විය සම්බන්ධ රසවත් කතන්දරවලට සවන්දීම මගේ ප්‍රියතම විනෝදාංශය විය.

මගේ මිත්තනිය පැවසූ අන්දමට මෙම සෑම සිද්ධියක්ම සිදුවූ කාල පරාසය නම් එක්දාස් නවසිය දශකයේ මුල භාගයයි. ගමේ වැදගතකු ලෙසද පිළිගැනීමක් තිබූ ආරච්චි පට්ටම ඒ කාලයේ හිමිව තිබුණේ මගේ මිත්තනියගේ පියාටය. ගැමියන්ගේ එදිනෙදා ජීවිතයේ පැන නගින බොහෝ ගැටළු සහ ප්‍රශ්ණ විසඳා ගැනීමට ඔහුගේ සහාය පතා ආරච්චි නිවසට ගැමියන් පැමිණීම එකළ සුලභ සිද්ධියකි. ඒ ප්‍රශ්නවලට පිළිතුරු සොයා දී ගැමියනට පිහිටවීම ආරච්චි මහතාගේ කාර්ය භාරය වන අතර, ඒ ඒ අවස්ථාවට අනුව තේ වතුරන් බත, බුලතින් සංග්‍රහ කිරීම පවුලේ සෙස්සන්ට පැවරුන වගකීමක් විය.

ඒ කාලයේ ඇස්වහ කටවහ කාරයෙකු යැයි ගමේ නම් දරා සිටි ''ඒබරා'' නම් පුද්ගලයා අවශ්‍යතාවයත් ඇතත් නැතත්, සතියකට හමාරකට වතාවත් නම් අනිවාර්යයෙන්ම ආරච්චි ගෙදරට පැමිණි අයෙකි. ඔහු බොහෝ විට පැමිණෙන්නේද ඉර මුදුන් සමයමෙනි. ඒ මන්ද යත් ඒ වෙලාවේ පැමිණෙන ඕනෑම අයෙකුට දහවල් බත නොවරදින බව ඔහු අත්දැකීමෙන් දන්නා බැවිනි. එකළ යස ලම්ස්සියන්ව සිටි මගේ මිත්තනියට සහ ඇගේ බාල සහෝදරියන් දෙදෙනාට නම් ඔහුගේ පැමිණීම මහත් හිරිහැරයක් විය. එයට හේතුව ඒ බරට පැමිනි මොහොතේ සිට ඔහු ආපසු යන තෙක් ඔවුනට එළිපෙහෙළියේ ගැවසීම, ඇගේ මෑණියන් විසින් තහනම් කිරීමයි. දහවල් බත සප්පායම් වන මොහු ඊළඟට කරන්නේ බුලත් වංගෙඩියේ දමා විටක් කෙටීමයි. එයින් පිටවන ශබ්දය ගෙට සිරවී සිටින අයවලුනට මිහිරි නාදයකි. තව නොබෝ වේලාවකින්ම නිවාස අඩස්සියෙන් මිදී නිදහස ලබන බවට එය ඉඟියකි.

එක්තරා දිනක බුලත් කොටන හඬ ඇසී බොහෝ වේලාවක් ගියද නිදහස නොලැබූ විට මගේ මිත්තනියගේ බාලම නැගෙනිය ''අම්මේ කටවහ ඒබරා'' උන්දෑ ගියාද අපිට ගේ ඇතුලෙන් එළියට එන්න'' යයි හඬ නගා ඇගේ මෑණියන් අමතා ඇත. එය අසුන ''ඒබරා'' උන්දෑ කුපිත වූ බව මගේ මිත්තනිය පැවසුවාය. ඔහු එදා මුළු හවස් වරුවම ගත කර ඇත්තේ ගම පුරා ඇවිදිමින් ආරච්චි ගෙදර ඇත්තන්ගේ නැහැදිච්චි කමට බැන අඬ ගැසීමටය.

කුරුණෑගල සිට මීගමුව දක්වා වූ මහා මාර්ගය හෙවත් සාමාන්‍ය ව්‍යවහාරයේ එන 'මීගමු පාර' කරත්ත පාරක සිට බස් පාරක් දක්වා පරිවර්ථනය වූ අඩවියේ සිදුවූ රසවත් සිද්ධියකි මෙය. පාරට ගල් දමා තලා, ඒ මතට පාර අයිනේ ගිනිමැල ගසා උනු කරන විශාල බැරල්වල ඇති තාර ගෙන වත් කරමින්, ගුරු පාර තාර පාරක් බවට පත් කරන මෙම කාර්යය ගැමියනට මහත් ප්‍රාතිහාර්යයක් බඳු විය. ''පාරෙ වැඩ''බැලීම සඳහා ඈත ගම් ගොඩවල සිට පැමිණෙන ගැමියනට තේ වතුරින්, බුලත් විටින් පවා සංග්‍රහ කිරීම පාර අද්දැර විසූවන් මහත් සතුටින්ම කල බවද මගේ මිත්තනියගේ මතකයේ රැඳී තිබිනි. මෙම පාර හඳන වැඩවලදී පාරට දමන ගල් තලා මට්ටම් කරන විශාල වාහනය වූ ''ගල් රෝල'' ගැමියනගේ මහත් කුතූහලයට බඳුන් වූ ආකාරයද එය වටහා ගත් එහි රියදුරා මාතලි දිව්‍ය පුත්‍රයා මෙන් මහත් උපාරුවෙන් එහි වැඩ කල අයුරුද මගේ මිත්තනිය පැවසුවේ සිනා පිරි මුවිනි.

දිනක් මෙම මහා පෙළහර නැරඹීමට පැමිණි ''ඒබරා උන්දෑ'' විශාල කරගත් දෑසින් මෙන්ම අයාගත් මුවින්ද මෙම ''ගල් රෝල'' දෙස සෑහෙන වේලාවක් බලා සිට ''හැබෑ නේන්නම්, මිනිස්සු දහ පහලොස් දෙනෙක් වරු ගානක් කරන වැඩක් මේ ගල් රෝල එක පැය භාගෙට කරනවනෙ'' යයි පැවසුවේලු. නොබෝ වේලාවකින් උදෑසන තේ බීම සඳහා නැවැත්වූ මෙම ගල් රෝල නැවතත් පණ ගන්වා ගැනීමට නොහැකිව දවස් තුනක් පමණ හිටි පිම්මේ ''ගල්රෝල'' ගළවූ බව අදය පවසන්නේ ''ඒබරා'' උන්දෑගේ කට වගේ තරම කොතරම් දැයි අපිට සිතා ගැනීමට ඉඩ හරිමිනි.

මිත්තනිය පවසන ආකාරයට ඊළඟ සිද්ධියට මුහුණ දී ඇත්තේ ඒබරාගේම මෑණියන්දෑය. ''ඒබරා'' කුඩා කොලුවා අවධියේම යම් යම් සිද්ධිවලින් තම වැඩිමල් දරුවා අස්වහ කටවහ කාරයෙකු බව වටහා ගැනීමේ මනා ''ඉවක්'' තිබූ ඒබරාගේ මව තම පුත්‍රයාගෙන් බොහෝ දේ සඟවා තබා ගැනීමට දැරූ උත්සාහයක් මේ කථාව තුළින් හෙළි වේ.

''ඒබරාගේ'' පියා විසින් තම කුළුඳුල් පුතුගේ උපත සිහිවනු වස් වත්ත පාමුලට වන්නට සිටවූ කොස් පැලයේ පළමු මුරයේ ඵලදාව දැක, එය තම පුතුගෙන් කෙසේ හෝ සඟවා තබා ගැනීමට උත්සාහ දරා ඇත්තේ පුතාගේ තරම දන්නා නිසාය. මේ නිසාම අදය දිනක් ''ඒබරාට'' කතා කොට පුතේ උඹ වත්ත පල්ලෙහා තියෙන කොස්ගම දිහාවෙ එහෙම යන්න එපා. වෙල පැත්තට තියෙන අත්තෙ ලොකු දෙඹරයක් බැඳලා තියෙනවා දැක්කා'' යයි පැවසුවේලු. එය ඇසූ ඒබරාට ඇතිවූයේ මහත් කුතූහලයකි. එනිසා පහුවදා උදේම කොස්ගහ පාමුලට ගොස් වටේම සෝදිසි කර ''මොන දෙඹරයක්ද, මේ තියෙන්නෙ අපූරුවට පනා මලුයි, පොලොස් ගැටයි, අවුරුද්ද පුරාම බැරුවයා කොස් කන්න'' යයි පැවසුවේලු. එම කොස් ගසේ පනා මල් හට ගත් පලමු වන සහ අවසාන අවස්ථාව එයම වූ බව මගේ මිත්තනිය මා හා පැවසුවාය.

එක්දාස් නවසිය දශකයේ මුල් භාගයේ සිදුවූවා යැයි මගේ මිත්තනිය පැවසූ එම සිද්ධීන් මෙන්ම මෑත අතීතයේ මට මුහුණපාන්නට සිදුවූ යම් සිදුවීමක්ද මගේ මතකයට නැගෙයි. මෙය සිදුවූයේ මගේ දියණිය ඉපදී මාස පහ හයකට පමණ පසුවය. දරුවාත්, වඩාගෙන අපේ දෙමව්පියන් දැක ගැනීම සඳහා ලංකාවට ගොස් දින කීපයකට පසු මගේ දියණියගේ අත් සහ පාදවල කුඩා ප්‍රමාණයේ රතු පාට බිබිලි කීපයක් දකින්නට ලැබුණි. මේවා මඳුරුවන් දෂ්ඨ කිරීමෙන් හට ගන්නට ඇතැයි සිතා අයය හැකිතාක් මඳුරු තර්ජනවලින් වළක්වා ගැනීමට අපි උත්සාහ කළෙමු. නමුත් මුලින්ම රතු බිබිලිවලට අමතරව ශරීරය පුරාම දිය බිබිලි මතුවීමට පටන් ගත් නිසා තත්ත්වය නරක අතට හැරිණි. මෙතැනදී අපේ වැඩිහිටියන්ගේ නොයෙක් ආකාරයේ අදහස් උදහස් වලට ඇහුම්කන්දීමට අපට සිදුවිය.

මේ අවස්ථාවේ මතුවූ නොයෙකුත් අදහස් අතර ඇස්වහ කටවහ වලටද නොසිතූ තරම් ජන්ද සංඛ්‍යාවක් හිමිවිය. දරුවාගේ නලලේ ලොකු ''මොට්ටුවක් නොතිබීම, ඉනට සහ දෑත්වලට කිරි පබලු නොබැඳීම වැනි අතපසුවීම්වලට මා කෙරෙහි බොහෝ දෝෂාරෝපණද එල්ල විය. අවසානම තීරණය ලෙස දරුවා ඉංග්‍රීසි වෛද්‍යවරයකුට පෙන්වන අතරම ඇස්වහ කටවහ දෝෂයට වතුරද මතුරවා ගැනීමට අපට සිදුවිය. වෛද්‍යවරයාට අනුව නම් සිදුවී තිබුනේ මඳුරු විෂ දරුවාගේ ශරීරයෙන් පිට කිරීමට එලෙස දිය බිබිලි මතුවීමයි. ඒ සඳහා ඔහු ප්‍රතිකාරද නියම කළේය.

කෙසේ නමුත් අපි ආපසු ඔස්ට්‍රේලියාවට පිටත්වීමට පෙර දරුවාගේ අත්වලට සහ ඉනට කිරි පබලු බැඳ, දිනපතා නලලේ 'මොට්ටු' තැබීමට ''මොට්ටු බෝතල්'' කීපයක් රැගෙන දීමට තරම් අපේ දෙමව්පියන් කාරුණික විය. නමුත් මෙහි පැමිණි දරුවා ඕස්ට්‍රේලියානු ජාතික ''ගෙල්ත් ෆර්ස්ට්'' පෙන්වූ අවස්ථාවේ මට ඊළඟ ගැටළුවට මුහුණ පාන්නට සිදුවිය. අදය මුලින්ම ඇසුවේ නලලේ තිලකය ගැනයි. එය දියණියට ආශීර්වාදය සඳහා කරන්නක් බව මා දුන් පිළිතුරයි. ඉන්පසුව ඇගේ අවධානය යොමු වූයේ දෑත් වල වූ කිරි පබලු වෙතයි. ඇගේ අත්දැකීමට අනුව නිතරම අත කටේ දමන වයසක වූ මගේ දියණියගේ ශරීර

34 වන පිටට

සුභාෂිනී හේරත්

ඇට්ලාන්ටා

සිංහල භාෂා පාසල

මහින්ද දිසානායක දිවුල්ගනේ

දීර්ඝ ඉතිහාසයකට නෑකම් කියන සිංහල භාෂාව ශ්‍රී ලංකාවේ ශ්‍රී ලාංකිකයන් පමණක් භාවිතා කිරීම ජාත්‍යන්තර වෙනත් භාෂාවකින් වෙන්ව හඳුනා ගැනීමට හැකිවීමේ විශේෂයකි. ඕනෑම දේශයක එහි භාෂාව, ආගම, ජාතිය මිනිසෙකුගේ සමාජයමය ජීවිතයේ උසස් හා පූජනීයත්වයෙන් සලකනු ලබන යහපත් වූ සමාජයක් ගොඩනැගීමේ හරයන් වේ. එයිනුත් භාෂාව එයින් තවත් විශේෂිත වූ සමාජ මෙහෙවරක් සිදුකරන බව පැවසීමද අතිශයෝක්තියක් නොවේ. ජාතියක කලාව, ආගම හා ඔවුන්ගේ සිතුම් පැතුම් අනෝන්‍ය සබඳතා තහවුරු කිරීමේ මෙහෙවරක යෙදෙන්නේ මෙම භාෂාවයි. එය විවාදයෙන් තොරව පිළිගත හැකි වූ සත්‍යතාවයකි.

රටක, ජාතිකයක ජීවනාලි බඳු වූ මෙම භාෂාව ජාතියක් හා තදින් බැඳී පවතින්නකි. එම ජාතියේ විශේෂිත වූ සලකුණක්, අනන්‍යතාවයක්, තදින් තහවුරු කරනු ලබන්නේ මේ භාෂාව තුළිනි. එහෙයින් ජාතියක් ලෙස අපේ වගකීම හා යුතුකම වන්නේ එහි ආරක්ෂාවයි. ඕනෑම භාෂාවක් ක්‍රමික විකාශනය තුළින් එහි වෙනස්වීම් හා වර්ධනය අපට විද්‍යාමාන වන අතර එය එකතැන තිබෙන දෙයක් ද නොවිය යුතුය. සිංහල භාෂාව පැරණිතම සංස්කෘත පාලි ආදී පෙරදිග භාෂාවන්ගෙන් පෝෂණය වුවද පෘතුගීසි ලන්දේසි ඉංග්‍රීසි යන ජාතිකයන්ගේ පැමිණීමෙන් ඔවුන් අතර පරිහරණය වූ වචන රාශියක් අපේ සිංහල භාෂාවට එකතුවීම නොවැළැක්විය හැක්කක් විය. විශේෂයෙන්ම ජාත්‍යන්තර භාෂාවක් වූ ඉංග්‍රීසි භාෂාවෙන් අපේ මෙම භාෂා පෝෂණය සඳහා ලඳ බලපෑම එදා ඉංග්‍රීසි ජාතිකයන්ගේ පැමිණීමේ ද පමණක් නොව අද ද විශාල ලෙස සිදුවේ. එය එහි ඇති ගුණාත්මක වූ ලක්ෂණයක් යනුවෙන් ප්‍රකාශ කිරීම නිවැරදි යයි සිතමි. ඒ කෙසේ වුවද ජාතියක අනන්‍යතාවය තබා කරන භාෂාව එම ජාතියේ පෞඩත්වය හා බැඳී පවතින අතර එය කලින් කල ආරක්ෂා කිරීම සියලු ජාතීන් සතු වූ යුතුකමකි.

විශේෂයෙන් ශ්‍රී ලංකාවේ වාසය කළ අපට එහිදී භාෂාව ආරක්ෂා කිරීමේ විශේෂිත අවශ්‍යතාවක් ඇති නොවූ වද විදේශ රටක ජීවත් වන අපට එහි ඇති අවශ්‍යතාවය තදින් දැනේ. මෙම රටේ ජීවත් වන ශ්‍රී ලාංකික සිංහල ජාතිකයන් වන අපේ ජීවන ක්‍රමය සකස් වී ඇත්තේ ජාතියට ආවේනික පරම්පරාවෙන් ආදරයෙන් රැකගෙන ආ යම් සමාජ සාරධර්ම සමූහයක් හා සම්බන්ධ කර ගනිමිනි. ඕනෑම සමාජයක චිර පැවැත්ම සඳහා ප්‍රබල ලෙස උපකාරී වූ මෙම යහපත් වූ සමාජ සාර ධර්ම හා පුද්ගල අභිවෘද්ධිය හා බැඳී පවතී. එම මූලික වූ හරයන් පැරණිකල පැවැත ආවා සේ දම්වැලේ පුරුක් මෙන් අපෙන් පසු අපේ දරු පරම්පරාව සඳහා උරුම කළ යුතු වේ. අපේක්ෂා, දෙමව්පියන්ට සැළකීම, වැඩිහිටියන්ට ගුරුවරුන්ට සැළකීම, සහජීවනය අප තුළ වර්ධනය වූ මුදලින් අගය කළ නොහැකි සමාජ හරයන් වේ. අපේ සාහිත්‍ය, කලාව, සංගීතය, නැටුම් ආදී මේ සියලු දේ බැඳී පවතින්නේ භාෂාවන් සමගය.

අප ජීවත් වන ඕස්ට්‍රේලියානු සමාජයේ සමාජ ව්‍යුහය මුළිකව සකස් වී ඇත්තේ ඕස්ට්‍රේලියානුවන් ගෙන් හා විවිධ රටවලින් පැමිණි සංක්‍රමණික වූ ප්‍රජාවගේ සම්බන්ධතාවයෙනි. එම නිසා මේ රට බහුවාර්ගික නමින් හඳුන්වනු ලබන අතර ඒ ඒ ප්‍රජාවගේ සමාජ සිරිත් විරිත් හා සාරධර්ම, ආගම ධර්මය අනුව ඔවුන්ට කටයුතු කිරීමේ අපහසුතා නොමැත. එසේ නොවන්නවුන් කිසිම සමාජයකට අයත් නොවන ඕපපාතිකයන් වැනිය. අපේ දෙමාපියන්ගෙන් උරුම වූ යම් යම් පුරාණාර්ථ හා වටිනාකම් නිසා අපේ යහපත් වූ ජීවන ක්‍රමය සකස් වූ අයුරින් ඉදිරි පරම්පරාවටද දීම අපේ පරම වූ ජාතික මෙහෙවරකි. නොඑසේ නම්, මතු දවසක අපිටත් නැති මේ රටටත් නොමැති පිරිසක් එම නොවැළැක්විය හැකිය.

මෙහි උපදින දරුවනට, හැදෙන වැඩෙන දරුවනට ඉංග්‍රීසි ඉගැන්වීමට බලයෙන් අවශ්‍ය නොවේ. ඔවුනු ලංකාවේ සිටින සිංහල දරුවන් සිංහල කථා කරන්නා සේ ඉංග්‍රීසියෙන් සියලු දෑ කටයුතු කරති. එහෙත් මෙගිදී ඉගැන්විය යුත්තේ සිංහල භාෂාවයි. අපේක්ෂාවයි, ඒ තුළ අපේ සංස්කෘතිය, සදාචාරය, සාහිත්‍ය ආදී සියලු අංගයන් පෝෂණය වී තිබේ. ඒ අනුව මෙහි සංවිධානය වන සියලු සිංහල භාෂා පාසල් මගින් සිංහල ප්‍රජාවට සිදුකරන සේවාව අති විශාලය. ලංකාවට පා තැබූ දවසකදී අපේ දරුවන්ට අපිට, සිංහල බස කියන්නවාට වඩා සිංහල හොඳට කතා කරනවා නම් එයයි ආඩම්බරයට හේතුවන්නේ. එසේ නොමැතිව සිංහල නොදන්නවා යැයි පැවැසීම නොවේ. එසේ නම් අපි තාමත් සිටින්නේ යටත් විජිතවාදී අන්දානු කරණයෙහි.

තේරවිල්ල - තේරුම

යන්න